*සැ. යු.* - 2022.02.03 දින පළ වූ අංක 2266 දරන *ගැසට් පත්‍රයේ* III හා IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,267 - 2022 පෙබරවාරි මස 11 වැනි සිකුරාදා - 2022.02.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 46 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 49 |

*සැ. යු.*- (i) අධිහාර බද්ද පනත් කෙටුම්පත 2022 පෙබරවාරි මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සත්ව සුබසාධන පනත් කෙටුම්පත 2022 පෙබරවාරි මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 මාර්තු මස 04 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 පෙබරවාරි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ මහනුවර දිස්ත්‍රික්කයේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ආර්. එම්. ශමීර නුවන් රත්නායක වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.13 දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/පස්/788 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අමුහේනපතනෙහි පදිංචි දලුමුර ආරච්චිලාගේ වික්‍රමපාල වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. ඒ 5/115 යටතේ 1996.01.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.03.02 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පස්බාගේ කෝරළයේ වැවේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දෙකිඳ නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද මහනුවර මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 61/22/4 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මූ. පි. මහ 4320 දරන රේඛා සටහනේ අංක 14 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.1426 ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූද රජයේ ඉඩම අමුහේනපතන

| | | |
|---|---|---|
| උතුරට | : | 8, 11 සහ 10 වන කැබැල්ල, |
| නැගෙනහිරට | : | 10 වන කැබැල්ල, |
| දකුණට | : | 1 වන කැබැල්ල, |
| බස්නාහිරට | : | 5 වන කැබැල්ල. |

ආර්. එම්. ශමීර නුවන් රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
පස්බාගේ කෝරළේ.

2021 ඔක්තෝබර් මස 26 වැනි දින.

02-148/1

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ මහනුවර දිස්ත්‍රික්කයේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ආර්. එම්. ශමීර නුවන් රත්නායක වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.08.18 දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/පස්/503 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන වැවේගම, නාවලපිටිය පදිංචි ජයසේකර මුදියන්සේලාගේ පුංචිමැණිකේ වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඒ 4/117 යටතේ 1995.11.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.03.02 දිනට පෙර මාවෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පස්බාගේ පත්තුවේ/කෝරළයේ වැවේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දෙකිඳ නමැති ගමේ පිහිටා ඇත්තාවූ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 61/22/3; 61/22/4 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/... අංක මූ. පි. මහ 3873 දරන රේඛා සටහනේ අංක 43 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර/0.174ක විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූද රජයේ ඉඩම අමුහේනපතන

| | | |
|---|---|---|
| උතුරට | : | 37 වැනි කැබැල්ල |
| නැගෙනහිරට | : | 20 වැනි කැබැල්ල |
| දකුණට | : | 46, 45, 44 වැනි කැබැල්ල |
| බස්නාහිරට | : | 10 1/2 කැබැල්ල |

ආර්. එම්. ශමීර නුවන් රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
පස්බාගේ කෝරළේ.

2021 ඔක්තෝබර් මස 16 වැනි දින.

02-148/2

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර සහ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් උයන්වත්තේ ජයසිංහ මුදියන්සේලාගේ සම්පත් සුමන බණ්ඩාර ජයසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982 සැප්තැම්බර් තිස් වන දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/1489 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන ඇල්හේන ජනපදයේ පදිංචි ගල්කිස්සේ අධිකාරි ආරච්චිගේ එලිසා හාමිනේ වෙත ප්‍රදානය කොට මහනුවර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/G/68, 169,185, /812 යටතේ 1988.10.09 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.03.02 දින සිට මසක් ඉකුත්වීමට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුයි.

### උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ මහනුවර සහ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගංදහය උතුර කෝරලයේ උල්පතකුඹුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උල්පතකුඹුර, වැවතැන්න සහ කැටවල නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, මහනුවර මැනුම් අධිකාරි භාරයේ ඇති 1, 25/30.31.38.39 ක්ෂේත්‍ර පත්‍රයෙහි පි.පි. මහ 126 දරන පිඹුරෙහි අංක 51 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් රූඩ් 01, පර්චස් 12 ක් විශාලත්වය ඇත්තාවූද පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය, ඉඩම : ඇල්හේන ජනපදය.

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 50 සහ ප්‍රවේශ මාර්ගය |
| නැගෙනහිරට | : | ප්‍රවේශ මාර්ගය |
| දකුණට | : | ප්‍රවේශ මාර්ගය |
| බස්නාහිරට | : | කැබලි අංක 50 |

යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත් සතර හා ගඟවට කෝරළය.

2021 ජූලි මස 24 වැනි දින.

02-148/3

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් උයන්වත්තේ ජයසිංහ මුදියන්සේලාගේ සම්පත් සුමන බණ්ඩාර ජයසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983 දෙසැම්බර් නව වන දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/3368 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන මහකන්ද 1 ජනපදයේ පදිංචි එලවන මුදියන්සේලාගේ බිසෝමැණිකේ වෙත ප්‍රදානය කොට මහනුවර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක C2/293 යටතේ 1985.10.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය අද දින සිට මසක් ඉකුත්වීමට පෙර 2022.03.02 දින ට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුයි.

### උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ මහනුවර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහනුවර සහ ගඟවට කෝරළයේ මහකන්ද ග්‍රාමනිලධාරි කොට්ඨාසයේ පායින්ගමුව නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, මහනුවර මැනුම් අධිකාරි භාරයේ ඇති 25/52 ක්ෂේත්‍ර පත්‍රයෙහි මු.පි.මහ 203 දරන පිඹුරෙහි අංක 77 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 33 ක් විශාලත්වය ඇත්තාවූද පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය ඉඩම : මහකන්ද 1 ජනපදය

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 76 |
| නැගෙනහිරට | : | පාර රක්ෂිතය |
| දකුණට | : | කැබලි අංක 80 හා 78 |
| බස්නාහිරට | : | ප්‍රවේශ මාර්ගය |

යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත් සතර හා ගඟවට කෝරළය.

2021 ජූලි මස 24 වැනි දින.

02-148/4

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර සහ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් උයන්වත්තේ ජයසිංහ මුදියන්සේලාගේ සම්පත් සුමන බණ්ඩාර ජයසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988 දෙසැම්බර් පහළොස් වන දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/10581 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කොස්සින්න ජනපදයේ පදිංචි වල්පිටගේ දොන් මේරිනෝනා වෙත ප්‍රදානය කොට මහනුවර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/G/68, 81B/518 යටතේ 1991.05.20 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.03.02 දින සිට මසක් ඉකුත්වීමට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතුයි.

උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ මහනුවර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගංදහය උතුර කෝරලය ලෙව්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කැටවල, ලෙව්ල නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, මහනුවර මැනුම් අධිකාරි භාරයේ ඇති 1 25/39 ක්ෂේත්‍ර පත්‍රයෙහි මු. පි. මහ 77 දරන පිඹුරෙහි අංක 96 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් රූඩ් 01, පර්චස් 07 ක් විශාලත්වය ඇත්තාවූද පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය, ඉඩම : කොස්සින්න ජනපදය

| | | |
|---|---|---|
| උතුරට | : | ප්‍රවේශ මාර්ගය |
| නැගෙනහිරට | : | කැබලි අංක 98 |
| දකුණට | : | කැබලි අංක 97 |
| බස්නාහිරට | : | කැබලි අංක 97 හා ප්‍රවේශ මාර්ගය |

යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත් සතර හා ගඟවට කෝරළය.

2021 ජූලි මස 24 වැනි දින.

02-148/5

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. ටී. පී. සුමනසේකර වන මම ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.12.12 දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/උනු/839 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වැටඅස්සවත්ත ජනපදයේ පදිංචි තෙල්කාර ගෙදර කමලාවතී වෙත ප්‍රදානය කොට ඇති මහනුවර ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/C/02/235/97 යටතේ 1997.07.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022 මාර්තු 02 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම්දිය යුතුය.

උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැද පළාත කෝරළේ වරකාගොඩ ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ කිරිවුවල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද මහනුවර මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 54/22/2 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු. පි. මහ 2532 දරන පිඹුරේ/අංක 22 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර බින්දුවයි දශම එකයි බින්දුවයි දෙක (හෙක්ටයාර් 0.102) ක විශාලත්වය ඇත්තාවූ ද පහත දක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම : වැටඅස්සවත්ත

| | | |
|---|---|---|
| උතුරට | : | පාර |
| නැගෙනහිරට | : | කට්ටි අංක 21 |
| දකුණට | : | හි.පි. 53510, වලව්වත්ත |
| බස්නාහිරට | : | කට්ටි අංක 23 |

ආර්. ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
උඩුනුවර.

2021 මැයි මස 05 වැනි දින.

02-148/6

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) වගුරේ ගමරාළලාගේ යමුනා ප්‍රියදර්ශනී දයාරත්න, වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983.03.07 දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/2012 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මොරහේන ජනපදයේ පදිංචි මහකුඹුරේ ගෙදර විමලසේන වෙත ප්‍රදානය කොට ගම්පොළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක සී 05/282 යටතේ 1990.06.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022 මාර්තු මස 02 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතුය.

උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳුකර පහළ පත්තුවේ/කෝරළේ තුම්පැලවක ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මුල්ගම නමැති ගමේ පිහිටා ඇත්තා වූද, සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක පී. පී. ඒ. 26 දරන රේඛා සටහනේ අංක 86 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් දහ තුන වූ විශාලත්වය ඇත්තාවූ ද, පහත දක්වෙන මායිම් වූද රජයේ ඉඩම : මොරහේන

| | | |
|---|---|---|
| උතුරට | : | කට්ටි අංක 71 සහ70 |
| නැගෙනහිරට | : | කට්ටි අංක 90 |
| දකුණට | : | කට්ටි අංක 89 සහ 88 |
| බස්නාහිරට | : | කට්ටි අංක 85 |

ඩබ්. ජී. වයි. පී. දයාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
දොළුව.

2021 අප්‍රේල් මස 03 වැනි දින.

02-148/7

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/63510.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :පීඑල්සී/එල්2/18/7/18-2018.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

ගම්පහ දිස්ත්‍රික්කයේ ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 206 බී, විශාඛාවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඒකල කුරුඳුවත්ත ගමේ පිඹුරු අංක මු. පි. ගම්. 427 හි කැබලි අංක 11 න් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.100ක් වාණිජ කටයුතු සඳහා ඇලුමෙක්ස් පී. එල්. සී. ආයතනය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඒ. වයි. ඇස්. ඥානම් හිමිකම් කියන මඩමවත්ත සහ කැබලි අංක 10, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 10 සහ කැබලි අංක 9 (පාර), |
| *දකුණට* | : | කැබලි අංක 9 (පාර) සහ කැබලි අංක 18, |
| *බටහිරට* | : | කැබලි අංක 18 සහ ඒ. වයි. ඇස්. ඥානම් හිමිකම් කියන මඩමවත්ත. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2021.12.10 දින සිට 2051.12.09 දක්වා).

(ආ) *වාර්ෂික බදු මුදල*.- ගරු ඇමතිතුමා අනුමත කරන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොල වටිනාකමින් 2%කි. ගරු ඇමතිතුමා අනුමත කරන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ

ඉඩමේ වෙළෙඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

වාර මුදල.- වාර මුදලක් අය නොකෙරේ.

*(ඈ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2021.12.10 දින සිට වසර පහක් ගතවන තුරු අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක ද ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොලියක් අයකරනු ලැබේ.

*(ඒ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එන්. එම්. ටී. ජානිකා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 පෙබරවාරි මස 11 වැනි දින,
අංක 1200/6 හි, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-151

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/67910.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : SPLC/MAT/1/30/3/72.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මාතර දිස්ත්‍රික්කයේ මාතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කැකණඳුර මධ්‍යම ග්‍රාම නිලධාරි වසමේ කැකණඳුර ගමේ ඉඩම් නිලධාරි විසින් සකසන ලද දළ අනුරේඛනයේ දක්වෙන ප්‍රමාණයෙන් අක්. 01 පර්. 37.89 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා ජේ. ජේ. මිල්ස් ලංකා (පුද්.) සමාගම විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු. පි. මාර. 2829 හි කැබලි අංක 03, මු. පි. මාර. 2830 හි කැබලි අංක 01, |
| *නැගෙනහිරට* | : | ප්‍රවේශ මාර්ගය, |
| *දකුණට* | : | ප්‍රවේශ මාර්ගය, |
| *බටහිරට* | : | මෙම අනුරේඛනයේ N, U කැබලි. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2021.12.10 දින සිට වසර 30ක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල.*- 2021 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොල වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000)ට වඩා වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකරේ.

*(ආ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඈ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2021.12.10 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

ගැසට් කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ටී. එන්. කාරියවසම්,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 පෙබරවාරි මස 11 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-122

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/65717.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NWP/PLC/L9/CH/LTL/03.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 548, පුංචි විලත්තව ග්‍රාම නිලධාරි වසමේ පුංචි විලත්තව ගමේ මූ. පි. පු. 5396 හි කැබලි අංක 1 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0764 ක් වූ රජයේ ඉඩම් කොටස කෝප්සිටිය හා ග්‍රාමීය බැංකුව පවත්වාගෙන යාම සඳහා සීමාසහිත මාදම්පේ විවිධසේවා සමුපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

*කැබලි අංක :* "1"

*උතුරට* : පු 4958 වැනි මූලික පිඹුරේ කැබලි අංක 01,
*නැගෙනහිරට* : ඒ 514 වැනි මූලික පිඹුරේ කැබලි අංක 37 සහ මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය,
*දකුණට* : මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය සහ කැබලි අංක 02,
*බටහිරට* : කැබලි අංක 02 සහ පු. 4958 වැනි මූලික පිඹුරේ කැබලි අංක 01.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2021.08.10 දින සිට ඉදිරියට).

*(ආ)* *වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2021 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි.

වාර මුදල.- නැත.

*(ඇ)* මෙම ඉඩම සීමාසහිත මාදම්පේ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත කෝප්සිටිය හා ග්‍රාමීය බැංකුව පත්වාගෙන යාම සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඊ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2021.08.10 දින සිට වසර 05ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඵ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*මෙම නිවේදන පළ වූ දින* සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. ඒ. කලානි එම්. ධනසේකර,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 පෙබරවාරි මස 11 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලය, අංක 1200/6හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-152

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/67252.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මොණරාගල දිස්ත්‍රික්කයේ, පහත උපලේඛනයේ විස්තර කෙරෙන රජයේ ඉඩම් කොටස් කෘෂිකාර්මික කටයුතු සඳහා එහි නම් සඳහන් පුද්ගලයන් නමින් දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2021.12.10 දින සිට වසර 30ක් ඉදිරියට).

*(ආ)* *වාර්ෂික බදු මුදල.*- 2021 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි. 2021 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාද ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2021.12.10 දින සිට වසර 05ක් ගත වන තුරු අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඒ. කේ. එන්. සෙව්වන්දි අමරසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 පෙබරවාරි මස 11 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, ''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *අනු. අංකය* | *ගොනු අංකය* | *නම* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨා-සය* | *ග්‍රාම නිලධාරි වසම* | *ගම* | *පිඹුරු/ අනුරේඛන අංකය* | *කැබලි අංකය* | *ඉඩමේ ප්‍රමා-ණය* | *ඉඩමේ මායිම* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4/10/ 67252 | උභය අනිල් බණ්ඩාර මැදවල | කතරගම | 146 ඩී, කරවිලේ | මයිලගම | අ. භූ. පි. 25 කැබලි අංක 4650 කොටසක් පෙන්වීමට අඳින ලද දළ අනුරේඛනයේ කැබලි අංක A | | අක්. 03 රූඩ් 02 පර්. 36.4 | උතුරට : පී. ජී. විල්සන් හිමිකම් කියන ඉඩම, නැගෙනහිරට : මයිලගම වැව් රක්ෂිතය, දකුණට : ඩබ්. පී. සුගතපාල හිමිකම් කියන ඉඩම, බටහිරට : මාර්ග රක්ෂිතය. |

| අනු. අංකය | ගොනු අංකය | නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨා-සය | ග්‍රාම නිලධාරි වසම | ගම | පිඹුරු/ අනුරේඛන අංකය | කැබලි අංකය | ඉඩමේ ප්‍රමා-ණය | ඉඩමේ මායිම |
|---|---|---|---|---|---|---|---|---|---|
| 02. | 4/10/67250 | හේවා මුදලිගේ විජිත කුමාර | කතරගම | 146 සී, කඳසුරි-දුගම | දෙටග මුව | අ.හූ.පි 25 කැබලි අංක 4020න් කොටසක් පෙන්වීමට අඳින ලද දළ අනුරේඛනයේ කැබලි අංක 1, 2, 3 | | අක්.01 රූඩ් 01 පර්.13.7 | උතුරට : අංක 38 දරන ඉඩම, නැගෙනහිරට : මාර්ග රක්ෂිතය, දකුණට : සීලවතී හිමිකම් කියන ඉඩම සහ අංක 40 දරන ඉඩම, බටහිරට : මාර්ග රක්ෂිතය. |
| 03. | 4/10/67233 | තල්පාවිල විදාන කංකා-නම්ගේ රේණු ලක්මාලි | කතරගම | 146 ඞී, කරවිලේ | කරවිලේ | අ. හූ පි. 25 | 4137 | හෙක්. 0 6177 | උතුරට : කැබලි අංක 4016, 4017, 4018 සහ මාර්ගය නැගෙනහිරට : මාර්ගය, දකුණට : මාර්ගය, බටහිරට : කැබලි අංක 4135 සහ 4136 |
| 04. | 4/10/67240 | මුහන්දිරම් මුදියන්සේ-ලාගේ ජයසුන්දර | මඩුල්ල | 104 සී, ගල්ගමුව | ගල්ගමුව | දළ අනුරේඛනය | ඒ | අක්. 04, රූඩ් 02, පර්. 6.5 | උතුරට : ආර්. එම්. උක්කුමැණිකා හිමිකම් කියන ඉඩම, නැගෙනහිරට : එම්. එම්. ලීලාවතී හිමිකම් කියන ඉඩම සහ පාර රක්ෂිතය, දකුණට : පාර රක්ෂිතය, බටහිරට :සියඹලා-කුඹුර වැව් කණ්ඩිය රක්ෂිතය. |

02-150

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/67229.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මොණරාගල දිස්ත්‍රික්කයේ කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහත උපලේඛනයේ විස්තර කෙරෙන රජයේ ඉඩම් කොටස් වාණිජ කටයුතු සඳහා එහි නම් සඳහන් පුද්ගලයන් නමින් දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2021.12.10 දින සිට වසර 30ක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල*.- 2021 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි. 2021 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000)ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල*. - වාර මුදලක් අය නොකරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඉ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2021.12.10 දින සිට වසර 05 ක් ගත වන තුර අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඒ. කේ. එන්. සෙව්වන්දි අමරසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 පෙබරවාරි මස 11 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *අනු. අංකය* | *ගොනු අංකය* | *නම* | *ග්‍රාම නිලධාරි වසම* | *ගම* | *පිඹුරු/ අනුරේඛන අංකය* | *කැබලි අංකය* | *ඉඩමේ ප්‍රමා- ණය* | *ව්‍යාපෘ තිය* | *ඉඩමේ මායිම්* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 4/10/67229 | කව්සි විදා- නෙලාගේ ඥානරත්න | 146 ඩී කරවිලේ | මයිලගම | අ.භූ.පි 25හි කැබලි අංක 858 හා 859න් කොටසක් පෙන්වීමට අඳින ලද දළ අනුරේඛනයේ කැබලි අංක A | | රූඩ් 02 පර්. 28.6 | ගෙස්ට් හවුස් සෙල්ල- කතරගම | උතුරට : මාර්ග රක්ෂිතය, නැගෙනහිරට : ඩී. සොයිසා හිමිකම් කියන ඉඩම, දකුණට : සුනිල් හිමිකම් කියන ඉඩම හා ඩී. සොයිසා හිමිකම් කියන ඉඩම්, |

| අනු. අංකය | ගොනු අංකය | නම | ග්‍රාම නිලධාරි වසම | ගම | පිඹුරු/ අනුරේඛන අංකය | කැබලි අංකය | ඉඩමේ ප්‍රමා- ණය | ව්‍යාපෘ තිය | ඉඩමේ මායිම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | බටහිරට : ආර්. පී. ජී. ජයතිලක හිමිකම් කියන සහ පී. හෙට්ටිආරච්චි හිමිකම් කියන ඉඩම් |
| 02 | 4/10/67242 | පතිරගේ දෙන් සමන් කුමාර | 146 සී, කඳසුරි- ඳුගම | කඳසුරි- ඳුගම | දල අනු- රේඛනය | A | පර්. 38.1 | සිරිමිහිඳු නිවාඩු නිකේත- නය | උතුරට : පන්සලේ ඉඩම හා වියළි ඇල රක්ෂිතය, නැගෙනහිරට : වියලි ඇල රක්ෂිතය හා ජයසිංහ හිමිකම් කියන ඉඩම දකුණට : ජයසිංහ හිමිකම් කියන ඉඩම සහ ජයන්ත හිමිකම් කියන ඉඩම්, බටහිරට : ජයිසිංහ හිමිකම් කියන ඉඩම සහ පන්සලේ ඉඩම. |
| 03 | 4/10/67245 | වීරසිංහ චරිත් මියුරංග | 146 බී, දෙටග- මුව | වල්ලි- මාතාගම | අ. භූ. පි. 25 හි කැබලි අංක 4682න් කොටසක් පෙන්වීමට අඳින ලද දළ අනුරේඛයේ කැබලි අංක A | | රූඩ් 01 පර්. 15 | ඩොක්- විලා පැලස් | උතුරට : කැබලි අංක 4691, නැගෙනහිරට : කැබලි අංක 4691, දකුණට : කැබලි අංක 4686, බටහිරට : කැබලි අංක 4691 |

| අනු. අංකය | ගොනු අංකය | නම | ග්‍රාම නිලධාරි වසම | ගම | පිඹුරු/ අනුරේඛන අංකය | කැබලි අංකය | ඉඩමේ ප්‍රමා-ණය | ව්‍යාපෘ තිය | ඉඩමේ මායිම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 04 | 4/10/67251 | ගිංතොට පරණ විදානගේ සුජීව නා-නායක්කාර | 146 ඩී, කරවිලේ | මයිලගම | දල අනුරේ-ඛනය | A | රූඩ් 01 පර්. 26.5 | සයුනි හොල්ඩේ රිසෝර්ට් | උතුරට : මනම්පේරි හිමිකම් කියන ඉඩම සහ ප්‍රධාන මාර්ග රක්ෂිතය, නැගෙනහිරට : ප්‍රධාන මාර්ග රක්ෂිතය සහ ඥානතිලක හිමිකම් කියන ඉඩම, දකුණට : ඥානතිලක හිමිකම් කියන ඉඩම, බටහිරට : ඥානතිලක හිමිකම් කියන ඉඩම හා මනම්පේරි හිමිකම් කියන ඉඩම් |
| 05 | 4/10/67244 | වෙන්න-වත්තගේ චමින්ද ප්‍රියනාත් ආරියදස | 146 බී, දෙටග-මුව | බෝධි-රාජපුර | දල අනු-රේඛනය | A | අක්. 02 | වැලේ රිසෝර්ට් | උතුරට : කේ. එම්. එම්. ජී. ප්‍රේමරත්න හිමිකම් කියන ඉඩම, නැගෙනහිරට :ආර්. ඒම්. ඒ. නදික හිමිකම් කියන ඉඩම, දකුණට : මාර්ග රක්ෂිතය (කතරගම සිතුල්පව්ව) බටහිරට : ඔස්කා විජේතුංග හිමිකම් කියන ඉඩම සහ ප්‍රවේශ මාර්ගය. |
| 06 | 4/10/67243 | නලවන හේවාගේ ගාමිණී සුභසිංහ | 146 ඩී, කරවිලේ | මයිලගම | දල අනු-රේඛනය | A | රූඩ් 01 පර්. 3.6 | භාග්‍යා රෙස්ට් | උතුරට : මැලේරියා පර්යේෂණ මධ්‍යස්ථානය, නැගෙනහිරට : රත්නදීප හිමිකම් කියන ඉඩම, දකුණට : එස්. අබේසිරිවර්ධන හිමිකම් කියන ඉඩම, බටහිරට : මාර්ගය |

| අනු. අංකය | ගොනු අංකය | නම | ග්‍රාම නිලධාරි වසම | ගම | පිඹුරු/ අනුරේඛන අංකය | කැබලි අංකය | ඉඩමේ ප්‍රමා- ණය | ව්‍යාපෘ තිය | ඉඩමේ මායිම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 07 | 4/10/67248 | උපුල් මහින්ද කොඩිතු- වක්කු | 146 ඩී, කරවිලේ | මයිලගම | අ. භූ. පි. 25 | 4692 හා 4693 | හෙක්. 0.1164 | නිවහන රිසෝට් | උතුරට : කැබලි අංක 4699 නැගෙනහිරට : කැබලි අංක 4699 සහ අතුරු පාර දකුණට : කැබලි අංක 4694 සහ 4699 සහ අතුරු පාර, බටහිරට : කැබලි අංක 4694 සහ 4699. |
| 08 | 4/10/67249 | හෙන්දහේ- වා චන්ද්‍රා ජයන්ති | 146 ඩී, කරවිලේ | මයිලගම | දල අනු- රේඛනය | A | රූඩ් 02 | එස්. එච්. ටී. යූ. රෝ රෙස්ට් | උතුරට : කිත්සිරි සහ ඒ ඒ සුහානි අංජුලා හිමිකම් කියන ඉඩම්, නැගෙනහිරට : ඒ. ඒ. සුහානි අංජුලා හිමිකම් කියන ඉඩම සහ අතුරු පාර රක්ෂිතය, දකුණට : අතුරු පාර රක්ෂිතය සහ ඩී. ඩී. ද සිල්වා හිමිකම කියන ඉඩම, බටහිරට : ඩී. ඩී. ද සිල්වා හිමිකම් කියන ඉඩම සහ කිත්සිරි හිමිකම් කියන ඉඩම. |
| 09 | 4/10/67232 | නිහාල් රංජිත් කළු- ආරච්චි | 146 ඩී, කරවිලේ | මයිලගම | අ. ග. පි. 25 | 4695 | හෙක්. 0.0900 | අරලිය රෙස්ට් | උතුරට : කැබලි අංක 4699 සහ 4694, නැගෙනහිරට : කැබලි අංක 4694 සහ අතුරු පාර, දකුණට : අතුරු පාර සහ කැබලි අංක 4696, බටහිරට : කැබලි අංක 4694 සහ 4699. |

| අනු. අංකය | ගොනු අංකය | නම | ග්‍රාම නිලධාරී වසම | ගම | පිඹුරු/ අනුරේඛන අංකය | කැබලි අංකය | ඉඩමේ ප්‍රමා- ණය | ව්‍යාපෘ තිය | ඉඩමේ මායිම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | 4/10/67254 | සීක්කුගේ නිලුක් චන්දිමාල් | 146, කතරගම | ගාමිනී පුර | අ. හූ.පි 25 හි කැබලි අංක 4523න් කොටසක් පෙන්වීමට අඳින ලද දළ අනුරේඛය | | පර්. 20.7 | චන්දිමාල් ඉන් | උතුරට : හරීන් හිමිකම් කියන ඉඩම, නැගෙනහිරට : හරීන් හිමිකම් කියන ඉඩම, දකුණට : මැණික් ගඟ රක්ෂිතය (මාර්ග රක්ෂිතය) බටහිරට : කේ. කරුණාරත්න හිමිකම් කියන ඉඩම. |
| 11 | 4/10/67267 | ලොකුගේ පේමසිරි | 146 ඩී, කරවිලේ | මයිලගම | දළ අනු- රේඛනය | A | අක්. 01 රූඩ් 03 පර්. 9.5 | මූන්ස්- ටෝන් රෙස්ට් | උතුරට : ඩබ්. ඒ. සංජීව සහ තවත් අය හිමිකම් කියන ඉඩම නැගෙනහිරට : ඩබ්. එන්. ද සිල්වා සහ හෙන්ද්‍රික් රුබසිංහ හිමිකම් කියන ඉඩම, දකුණට : මාර්ග රක්ෂිතය, බටහිරට : කේ. වී. ඒ. ආරියවංශ හිමිකම් කියන ඉඩම සහ අඩි පාර. |

02-149

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/68769.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/LS/TRI/KIN/22.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සූරංගල් - 226 එන් ග්‍රාම නිලධාරී වසමේ සූරංගල් ගමේ 0717 පිඹුරේ කැබලි අංක 01 දරන ප්‍රමාණයෙන් පර්චස් 47.46ක් වූ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා තෞෆික් මොහොමඩ් ජාරුක් මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ප්‍රධාන පාර (මා. ස. අ) |
| *නැගෙනහිරට* | : | ප්‍රධාන පාර (මා. ස. අ.) |
| *දකුණට* | : | කැබලි අංක 02, |
| *බටහිරට* | : | ඇළ මාර්ග. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2022.01.15 සිට ඉදිරියට).

*වාර්ෂික බදු මුදල*.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොල වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මකවන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල*. - වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාදා ඇති/සහ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බදු අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එම්. එල්. ඒ. සංජීව,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 පෙබරවාරි මස 11 වැනි දින,
අංක 1200/6 හි, ඉඩම් මහලේකම් කාර්යාලයේ, ''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි.
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-196